# අශ්‍රද්ධාවන්ත පවට ලජ්ජා බිය නැති නුවණ නැති සැමියා ඉක්මවා හැසිරෙන කාන්තාව දුගතිගාමී වෙයි

## අතිචාරී සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 4 - පිටු අංක 456 - 457)

දහම් පහකින් යුත් කාන්තාව මරණින් පසු සැප නැති, නපුරු වැටීමක් වූ දුක් ඇති නිරයෙහි උපදින්නීය.

කවර දහම් පහකින් ද යත්;

1. ශ්‍රද්ධා නැත්තියක් වෙයි.
2. පවට ලජ්ජා නැත්තියක් වෙයි.
3. පවට බිය නැත්තියක් වෙයි.
4. සිය සැමියා ඉක්මවා හැසිරෙන්නියක් වෙයි.
5. නුවණ නැත්තියක් වෙයි.

මේ දහම් පහෙන් යුතු කාන්තාව මරණින් පසු සැප නැති, නපුරු වැටීමක් වූ දුක් ඇති නිරයෙහි උපදින්නීය.